# කෘෂිකර්මාන්ත අංශයේ සිදු වූ වෙනස්කම් ස්ත්‍රී ශ්‍රම දයකත්වයේ ප්‍රසාරණයට බලපෑමක් එල්ල කළේ ද?

## පුල්එළිය ගම්මානය ඇසුරින් විමසුමක් ...

අතීතයේ සිට කෘෂිකර්මය හා බැඳුනු ජීවන රටාවකට උරුමකම් කියන නුවරකලාවිය ප්‍රදේශයට අයත් සුන්දර ගම්මානයක් වන පුල්එළිය ගම තුළ තවමත් ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වන්නේ කෘෂිකර්මාන්තයයි. ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව සියලු දෙනා කෘෂිකාර්මික කටයුතුවල නිරත වන ආකාරයක්, මේ වන විට පුල්එළිය ගම තුළින් දක ගත හැකිය. විවිධ අංශයන් පුරා විහිදුනු ස්ත්‍රී ශ්‍රමය වර්තමාන කෘෂිකාර්මික අංශයේ දී ද ඉටු කරන්නේ වැදගත් මෙහෙයකි. මේ අනුව, වර්තමාන කෘෂිකාර්මික ක්ෂෙත්‍රය තුළ ස්ත්‍රීන්ගේ කාර්යභාරය ප්‍රසාරණය වී ඇතැයි සඳහන් කිරීම උචිත ය. වෙනත් අන්දමකින් සඳහන් කරන්නේ නම් අතීතයට සාපේක්ෂව සලකා බැලීමේ දී, කෘෂි ක්ෂෙත්‍රයේ කටයුතුවල වර්තමාන ස්ත්‍රියගේ කාර්යභාරය පුළුල් වී තිබේ. මෙලෙසින් කෘෂිකාර්මික අංශය තුළ සුවිශේෂී භූමිකාවක් ස්ත්‍රීන්ට හිමිවීම එක්වරම සිදු වූවක් නොව කාලානුරූපීව කෘෂි ක්ෂෙත්‍රයේ සිදු වූ නව වෙනස්කම් කිහිපයක් එයට හේතු වී ඇති බව පෙන්වාදිය හැකිය.

කෘෂිකාර්මික අංශය නව වෙනසක් කරා සීඝ්‍රයෙන් යොමු කරවීමට බලපෑ කාරණයක් වන්නේ කෘෂිකර්මාන්තයේ දී නව තාක්ෂණික ක්‍රමෝපායයන් භාවිතයට යොමු වීමයි. නව තාක්ෂණික ක්‍රමෝපායයන් යැයි සඳහන් කිරීමේ දී අතීතයේ ගොවිතැන් කටයුතුවල දී බිම් සැකැස්මට, අස්වැන්න පාගා ගැනීමට යොදු ගන්නා ලද 'මීගොන්' වෙනුවට 'ට්‍රැක්ටරය' එම කාර්යභාරය සඳහා ආදේශවීම පෙන්වාදිය හැකිය. සමස්ත කෘෂි ක්ෂෙත්‍රයේ කටයුතුවල සුවිශේෂී වෙනසක් කිරීමට ට්‍රැක්ටරයේ ආගමනය හේතු වී ඇතැයි සඳහන් කිරීම නිවැරදි ය. තවත් ලෙසකින් මෙය කෘෂිකාර්මික ක්ෂෙත්‍රය තුළ නව පෙරළියක් ඇතිවීමේ මූලාරම්භය ලෙසට ද සඳහන් කළ හැකිය.

අතීතයේ මීගොන් යොදා ගනිමින් කළ කාර්ය ට්‍රැක්ටර් භාවිතයෙන් සිදු කිරීම ආරම්භ වීමත් සමඟ කෘෂිකාර්මික කටයුතුවලට යොදා ගන්නා ලද භූමි ප්‍රමාණයේ ද වර්ධනයක් සිදු වී තිබේ. තම නිවසේ පරිභෝජනයට අවශ්‍ය ප්‍රමාණය නිෂ්පාදනය කර ගැනීමට අවශ්‍ය වූ කුඩා භූමි ප්‍රමාණය වෙනුවට විශාල භූමි ප්‍රමාණයක වගා කිරීමට ඉඩ ප්‍රස්ථා විවරවීමත් මේ සමඟ ම සිදු විය. එසේම ට්‍රැක්ටරය වැනි දියුණු තාක්ෂණික උපකරණ භාවිතයත් සමඟ කෘෂිකාර්මික කටයුතු ඉක්මණින් සහ පහසුවෙන් කිරීමට හැකි විය.

කෘෂි ක්ෂෙත්‍රයේ සිදු වූ නව තාක්ෂණික උපක්‍රම භාවිතයන් අතර වගා කටයුතුවල දී අතීතයේ පුල්එළිය ගම තුළ භාවිතා කරන ලද සාම්ප්‍රදායික කෙම් ක්‍රම වැනි ස්වභාවික පළිබෝධ පාලන ක්‍රම සහ කෘත්‍රිම රසායනික පොහොර භාවිතයට යොමුවීමක් පවතී. වර්තමානය වන විට මෙවැනි තත්ත්වයන් තුළ වගා කටයුතු සීඝ්‍රයෙන් ව්‍යාප්ත වීම සිදු වී තිබේ.

පුල්එළිය ගම තුළ අතීතයේ පැවති සාම්ප්‍රදායික යැපුම් කෘෂිකර්මාන්තය වාණිජ අරමුණු දක්වා වෙනස්වීම, කෘෂිකාර්මික ක්ෂෙත්‍රයේ සිදු වූ තවත් නව වෙනස්කමකි. දියුණු තාක්ෂණික ක්‍රමවේදයන්ගේ පැමිණීමත් සමඟ එම භාවිතාවන් මඟින් වැඩි බිම් ප්‍රමාණයක් වගා කිරීමේ පහසුවත් සමඟ වගා කටයුතු වර්ධනය වූවා සේම එහි ප්‍රතිඵලයක් ලෙස නිෂ්පාදනයේ අතිරික්තයක් ඇති වන්නට විය. එම අතිරික්තය වෙළඳපොළට විකිණීමත් ඒ තුළින් වගා කටයුතු වාණිජ අරමුණු දක්වා ව්‍යාප්තවීමත් නොවැළැක්විය හැකි දෙයක් විය.

මෙවැනි හේතු සාධකයන්ගේ බලපෑම මත කෘෂිකාර්මික අංශයේ සිදු වූ නව වෙනස්කම් එහි ස්ත්‍රී ශ්‍රම දයකත්වයට ද ඍජු බලපෑමක් එල්ල කරන ලද්දේ යැයි කිව හැකිය. අතීතයේ කෘෂිකර්මාන්තයේ දී උපයෝගී කර ගන්නා ලද සාම්ප්‍රදයික සරල ක්‍රමවේදයන් වෙනුවට දියුණු තාක්‍ෂණය භාවිතා වීමත් සමඟ වගා කටයුතුවල දී ස්ත්‍රීන්ට පැවති සාම්ප්‍රදයික විශ්වාස මත පදනම් වූ තහංචි ලිහිල්වීමක් ද නිතැතින්ම සිදු වී තිබේ. පුල්එළිය ගම තුළ සාම්ප්‍රදයික කෘෂිකර්මාන්තය හා බැඳුණු විවිධ චාරිත්‍ර වාරිත්‍ර හේතු කොට ගෙන ස්ත්‍රිය කෘෂිකාර්මික අංශයේ විවිධ අවස්ථාවල දී බැහැරව සිටීමක් සිදු වී තිබේ. එවැනි අවස්ථාවක් ලෙස "කමතේ" කටයුතු වලින් ස්ත්‍රිය බැහැරව සිටීම පෙන්වා දිය හැකිය. සාම්ප්‍රදයික අතීත කෘෂිකාර්මික කටයුතුවල දී කමතේ කටයුතුවලට සහභාගීත්වය දක්වා ඇත්තේ පුරුෂ පාර්ශවය පමණකි. කමත සැකැස්මේ සිට එහි කටයුතුවල අවසානය දක්වා සියලු කාර්යයන් පුරුෂ පාර්ශවයේ මැදිහත් වීමෙන් සිදු වී තිබේ. එනම්, කමත සැකැස්මේ දී කමත් භූමියේ ගොම ආලේප කිරීම, කොළ එළීම, කොළ පෑගීම, මැඩුවම් ඉවත් කිරීම, බත රාශී කිරීම යනාදී සියලු කාර්ය කොටස් සිදු කර ඇත්තේ පුරුෂ පාර්ශවය විසිනි. ස්ත්‍රීන්ට කමත් කටයුතුවලට සහභාගීවීමට අවසරයක් නො වීය. කමත වටා පිදුරු යොද ගනිමින් "වෙනියක්" සකසන ලද අතර එය ස්ත්‍රීන්ට සීමා පැන වූ බාධකයක් විය. ඉන් එපිටට කාන්තාවන්ට යෑමට අවසරයක් නො වීය. වර්තමානයේ පුල්එළිය ගම තුළින් දක ගත හැක්කේ මෙවැනි සාම්ප්‍රදයික චාරිත්‍ර වාරිත්‍රයන්ගෙන් කෘෂි කර්මාන්තය දුරස්ථ වී දියුණු තාක්‍ෂණික උපක්‍රම භාවිතයට ගන්නා ආකාරයයි. මේ නිසාවෙන් ස්ත්‍රිය සම්බන්ධයෙන් පැවති මෙවැනි සීමාවන් ද ලිහිල්වන්නට ඇතැයි සිතිය හැකි ය.

පුල්එළිය ගමෙහි සාම්ප්‍රදයික මට්ටමෙන් පැවති ස්වයංපෝෂිත යැපුම් කෘෂිකර්මාන්තය ඉන් බැහැර වී වාණිජ අරමුණු දක්වා වෙනස්වීමත් සමඟ කෘෂි නිෂ්පාදන අලෙවි කරමින් ආදයම් ඉපැයීමට යොමු වී ඇත. එහි ප්‍රතිඵලය වූයේ වැඩි බිම් ප්‍රමාණයක වැඩි වශයෙන් වගා කටයුතු කිරීමට ගැමියන් යොමුවීමයි. මෙම තත්ත්වය ඍජු හෝ වක්‍රාකාරයෙන් කෘෂිකාර්මික කටයුතුවල දී උපයෝගී කර ගන්නා ලද "සාමූහික ශ්‍රම දයකත්වයට" බලපෑමක් එල්ල කොට තිබේ. අතීතයේ වගා කටයුතුවල දී අවශ්‍ය ශ්‍රමය සපයා ගැනීමට අපහසුවක් නො වූයේ සියලු දෙනා එකට එකතු වී සාමූහිකව තම තමන්ගේ වගා කටයුතු කර ගත් නිසා ය. එනම්, එක යායට කුඹුරු ඉඩම් අස්වැද්දීම සිදු කළ අතර එක් අයෙකුගේ කුඹුරු ඉඩමක සියලු දෙනා එක්ව සාමූහිකව වැඩ කළෝය. දිනෙන් දින සියලු දෙනා සාමූහිකව එක් එක් පුද්ගලයාගේ වගා කටයුතුවලට සහභාගී වේ. මෙය පුල්එළිය ගැමියන් හඳුන්වන්නේ "**කයිය**" ක්‍රමය ලෙසයි. මෙය අතීත පුල්එළිය ගමේ සාමූහිකත්වය නිරූපනය කළ සාධකයක් ලෙසට ද අර්ථකතනය කළ හැකිය. මෙම ක්‍රමය අත්තම් ක්‍රමයක් ලෙස ද සඳහන් කළ හැකිය. මෙවැනි පරිසරයක් තුළ පුල්එළිය ගැමියන්ට කෘෂිකාර්මික කටයුතුවලට අවශ්‍ය ශ්‍රමය හිඟයක් නොවිණි. සියලු දෙනා එකතුව වගා කටයුතු කළ නිසා ශ්‍රමය සඳහා මුදල්මය ගෙවීමක් කිරීම අවශ්‍ය නො වීය. එනම්, ශ්‍රමයට ශ්‍රමය හුවමාරු කර ගැනීමක් සිදු වී තිබේ.

වර්තමානයේ පුල්එළිය ගමේ කෘෂිකාර්මික කටයුතුවල දී මෙලෙසින් සාමූහිකව ක්‍රියා කිරීම දක ගත හැකිවීම දුර්ලභ වූවකි. ඒ වෙනුවට දක ගත හැක්කේ තනි තනිව වගා කටයුතුවලට යොමු වීමයි. මේ නිසාවෙන් වගා කටයුතුවල දී තමන්ට අවශ්‍ය ශ්‍රමය මුදල් ගෙවීමකින් ලබා ගැනීමට සිදු වී තිබේ.

පුල්එළිය ගම තුළ කෘෂිකාර්මික කටයුතුවල දී පැවති සාමූහික ශ්‍රම දයකත්වය මෙලෙසින් වෙනස් වීම කෘෂිකාර්මික අංශයේ ස්ත්‍රී ශ්‍රම දයකත්වය වර්ධනයට හේතු වී යැයි සඳහන් කළ හැකිය. එසේම ශ්‍රමය ලබා ගැනීම සඳහා ගෙවිය යුතු මුදල කාලයත් සමඟ ක්‍රමක්‍රමයෙන් ඉහළ යාම නිසා ස්ත්‍රී ශ්‍රමය සපයා ගැනීමේ අවශ්‍යතාව නිතැතින්ම ඇති විය. සංක්‍ෂිප්තව මෙම කරුණ සඳහන් කරන්නේ නම් කෘෂිකාර්මික කටයුතුවල දී අවශ්‍ය ශ්‍රමය ලබා ගැනීම සඳහා වැඩි මිලක් ගෙවීමට සිදු

වීමත්, කාන්තාව කෘෂිකර්මාන්තයේ දී දක්වන ශ්‍රම දායකත්වය ඉහළ යාමට හේතු වී ඇත. මෙලෙසින් කෘෂි කර්මාන්තය තුළ උද්ගත වූ නව ශ්‍රම අවශ්‍යතාවය තුළ කෘෂිකාර්මික කටයුතුවල දී ස්ත්‍රීන්ට සාම්ප්‍රදායිකව පැවති සීමාවන් ඉවත් විය. එනම්, කෘෂිකාර්මික කටයුතුවල දී අවශ්‍ය ශ්‍රමය සැපයීමේ දී තෝරා බේරා ගැනීමකින් තොරව සියලු කාර්යයන් හි දීම ශ්‍රමය සැපයීමට ස්ත්‍රීන්ට සිදු විය. ප්‍රථම-යෙන්ම ස්ත්‍රීන් තම පවුලේ වගා කටයුතුවලට තම ශ්‍රම දායකත්වය සැපයීම ආරම්භ කරන ලද අතර පසුව තම ශ්‍රමය අලෙවි කිරීම ද සිදු කරන ආකාරය පුල්එළිය ගම තුළින් දැක ගත හැකි වේ.

මේ ආකාරයට සිදු වූ වෙනස්කම් තුළින් කෘෂිකර්මාන්තය තුළ ස්ත්‍රී කාර්යභාරය පුළුල් වීමක් සිදු වී ඇත. එනම්, අතීතයේ කෘෂිකාර්මික කටයුතුවල දී ස්ත්‍රීන්ට හිමි වූ අස්වැන්න නෙළීම, වගා කටයුතුවල නියැලෙන පිරිසට කෑම පිසීම, උදලු ගෑම, පැළ සිටුවීම වෙනුවට වගා කටයුතුවල මූලික බිම් සැකැස්මේ සිට අස්වැන්න නිවසට රැගෙන යන තෙක් සියලු කාර්යයන් හි දී ස්ත්‍රිය සහභාගී වන ආකාරය වර්තමානයේ දී දැක ගත හැකි ය. මේ අනුව වර්තමාන කෘෂිකාර්මික කටයුතුවල දී නියර කෙටීම, නියර බැඳීම, පෝරු ගෑම, වී ඉසීම, වගාවට අවශ්‍ය පළිබෝධනාශක සහ පොහොර යෙදීම, වතුර බැඳීම, අස්වැන්න නෙළීම, ගොයම් කොල ගොඩ ගැසීම, මැඩුවම් ඉවත් කිරීම, බැත රාශි කිරීම යනා දී බොහෝ කටයුතුවලට ස්ත්‍රිය තම ශ්‍රම දායකත්වය සපයයි. මෙලෙස අතීත වර්තමාන කෘෂිකාර්මික කටයුතුවල ස්ත්‍රී දායකත්වය සලකා බැලීමේ දී, ඒ තුළ ස්ත්‍රියගේ දායකත්වය වර්ධනය වී තිබෙන ආකාරය මනාව හඳුනා ගත හැකිය. මෙලෙසින් විග්‍රහ කර බැලීමේ දී කෘෂිකාර්මික අංශයේ ස්ත්‍රී ශ්‍රම දායකත්වය අතීතයට සාපේක්ෂව වර්තමානය තුළ ප්‍රසාරණය වීමට හේතු වී ඇත්තේ කෘෂිකර්මාන්තය තුළ සිදු වූ නව වෙනස්කම් යැයි සඳහන් කළ හැකිය.


**දීපිකා දමයන්ති බණ්ඩාර**

**විමර්ශිකා**

**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය**


◇◇◇◇◇◇◇◇◇◇◇◇◇◇◇◇◇◇◇◇◇◇◇◇◇◇◇◇◇◇◇◇◇◇◇◇◇◇◇◇◇◇◇◇

## ගොවි ජනතා

"**ගොවි ජනතා**" සඟරාව පිළිබඳව ඔබ දක්වන අදහස් හා ප්‍රතිචාර අපි ඉතා අගය කොට සළකමු. එසේම, ඒවා ඉදිරි කලාපයන් හි පල කිරීමට ද කටයුතු කෙරේ. එබැවින්, එවැනි ද සංස්කාරක වෙත දන්වා එවන මෙන් පාඨක ඔබට ආරාධනා කරමු.


**සංස්කාරක**

**"ගොවි ජනතා"**

**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.**

114. විජේරාම මාවත.

කොළඹ - 07.